**ශීර්ෂය 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2023 මැයි 24 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාර විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්තන වියදම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල සහනාධාර සහ මාරු කිරීම් වියදම් එකතුව රු.9,153,759 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රමාද දෝෂයකින් සහනාධාර සහ මාරු කිරීම් වියදම් එකතුව වෙනස් වූ බව. | මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ii) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල පුද්ගල පඩිනඩි සහ මෙහෙයුම් වියදම් එකතුව රු. 6,101,954 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රමාද දෝෂයකින් පුද්ගල පඩිනඩි සහ මෙහෙයුම් වියදම් එකතුව වෙනස් වූ බව. | මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට දෙපාර්තමේන්තුව සතු අක්කර 112.24 (හෙක්ටයාර 44.9) ක ඉඩම් 18 ක් හා වර්ග අඩි 70,320 ක ගොඩනැගිලි 49 ක වටිනාකම හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් (ඒසීඑ-06 සහ එස්ජී 82) යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තා ලබාගෙන පසුව ගිණුම් ගත කරන බව. | ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු රු. 8,206,747 ක මූල්‍ය නොවන වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ගිණුම්ගත කර නොතිබුණි. | පුනරාවර්තන වියදම්වලින් මිලදී ගත් මූල්‍ය නොවන වත්කම් බවත් ඒවා ඉදිරියේදී ගිණුම්ගත කරන බව. | මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | | | ගණන් දිමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති.රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | 2003 අංක 22 දරන බීජ පනතේ 08 (1) වගන්තිය | - | 2017 වසරේ සිට සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා කාලය තුල නිල්ලඹ උප පර්යේෂණ මධ්‍යස්ථානය පැළ නිෂ්පාදනය කර ඇතත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ලියාපදිංචි කර නොතිබුණි. | බීජ පනතේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය ආකෘති පත්‍ර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ අංශයෙන් මේ වන විට ලබා ගෙන ඇති අතර මේ සම්බන්ධව ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරන බව | පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කළයුතුය. |
| (ආ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | 1,130,095 | අත්‍යවශ්‍ය සේවාවන් නොවන ප්‍රමුඛතාවයන් ලබා දිය නොහැකි දෙපාර්තමේන්තුවේ කාර්යාලය තුල හා නිලධාරීන්ගේ පහසුකම් සඳහා අවස්ථා 09 කදී මුදල් වැය කර තිබුණි. | අත්‍යවශ්‍යම වියදම් ප්‍රමුඛතා ගත කිරීමෙන් අනතුරුව වසර අවසානයේ ඉතිරිව තිබුණු ප්‍රතිපාදන තුළින් ඉටු කර ගත් බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

### 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන් දිමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ විශ්‍රාම ගිය හා සේවය අවසන් කර තිබුණු නිලධාරීන් 09 දෙනෙකුගෙන් වසර 01 ත් 03 ත් අතර කාල පරාසයක සිට එකතුව රු.559,607ක ණය ශේෂයක් අය කරගෙන නොතිබුණි. | නිලධාරීන් තිදෙනෙකුගේ වයස අවුරුදු 45 ඉක්මවා ස්ථිර කිරීම හේතුකොට ගෙන විශ්‍රාම වැටුප හා පාරිතෝෂිකය අහිමි කර ඇති බවත් ඉදිරියේදී රජය ගන්නා ක්‍රියාමාර්ගය අනුව අයකර ගැනීමට කටයුතු කරන බවත් නිලධාරීන් 03 ක් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන ඇති බවත් අනිත් නිලධාරීන් තිදෙනා සමඟ ණය අයකර ගැනීමට සාකච්ඡා පවත්වන බවත්. | හිඟ ණය වාරික අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යයභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන් දිමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහනුවර දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ඉඩම මහවැලි ගඟට මායිම්ව පිහිටා ඇති අතර ගං ඉවුර දැඩිව ඛාදනය විම හේතුවෙන් ගඟ දෙසට ඉදිකර ඇති බැම්ම, රැස්වීම් ශාලාව, තාප්පය සහ ඉන්ටර්ලොක් ගල් අතුරා ඇති මිදුලද පුපුරා ඉරිතලා නාය යාමේ ඉහළ අවදානමක් පැවතියද ජීවිත හා දේපල ආරක්ෂා කරගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මහවැලි ගඟේ දකුණු ඉවුරේ මීටර 115 ක් දිග යෝජිත ගේබියන් බැම්මක් ඉදිකිරීම සඳහා අදාල ක්ෂේත්‍ර පරික්ෂා සිදු කර නිර්මාණ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 138.5 ක දළ ඇස්තමේන්තුවක් සකස් කර අවසන් කර ඇති බව. | දේපල හා ජීවිත හානි වලක්වා ගත යුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන් දිමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අපනයන කෘෂිභෝග නිෂ්පාදන ගොවිපළ, ගොවීන්, සැකසුම්කරුවන් සහ වෙළෙන්දන් ලියාපදිංචි කිරීම සහ ශ්‍රී ලංකාවේ ගම්මිරිස් සහ කුරුඳු සඳහා භූගෝලීය දර්ශක (GI) ලබා ගැනීමට අදාල ක්‍රියාකාරකම් සිදුකිරීමේ අරමුණින් 2020 අගෝස්තු 27 දින වන විට රු.10,647,000 ක් වැයකර ටැබ්ලට් පරිගනක 300 ක් මිලදීගෙන ආයතනගත හා ක්ෂේත්‍රගත නිලධාරීන් 300 දෙනෙකුට ලබා දී රු. 1,505,000 ක් වැයකර පරිගණක මෘදුකාංගයක්ද සංවර්ධනය කර හඳුන්වා දී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ටැබ්ලට් පරිගණක ලබාගත් 58 දෙනෙකු අදාල මෘදුකාංගය භාගත කරගෙන නොතිබුණි. එසේම අදාල පරිඝනක භාවිතා කර පසුගිය වර්ෂ 02 ක කාලය තුල සමස්ථ කුරුඳු ගොවීන් 250,000 කගෙන් 238 දෙනෙක් (සියයට 0.09) තරම් ඉතා අඩු ප්‍රමාණයක් ලියාපදිංචි කරගෙන තිබුණි.එම ප්‍රමාණය ලියාපදිංචි කිරීමද ටැබ් පරිඝනක 29 කින් පමණක් සිදු කර තිබුණි. එසේම අදාල මෘදුකාංගය භාවිතා කර එම කාලය තුල අපනයන කෘෂි භෝග නිෂ්පාදන ගොවිපල සැකසුම්කරුවන් හා වෙළඳුන් ලියාපදිංචි කිරීම කෙරෙහිද අවධානය යොමුකර නොතිබුණි. මෙසේ රු.1,505,000 ක් වැයකර මෘදුකාංගයක් හඳුන්වා දී ඒ සඳහා වාර්ෂිකව රු. 135,000 ක් බැගින් නඩත්තු වියදම් ගෙවිය යුතුව තිබුනද, ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෘදුකාංගය භාවිතා කර නොමැති බව කරන ලද විගණනයේදී නිරීක්ෂණය විය.ඒ අනුව රු. 12,152,000 ක් වැය කර ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණු ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 අප්‍රේල් මාසය වන විට කුරුඳු ගොවීන් 8000 ට වැඩි ප්‍රමාණයක ගේ තොරතුරු මෙම ඩිජිටල් පද්ධතියට එක්කර ගැනීමට හැකිවී ඇති අතර 2023 වර්ෂය අවසාන වන විට කුරුඳු ගොවීන් 50,000 කගේ තොරතුරු මෙම පද්ධතියට ඇතුලත් කිරීමට ඉලක්කගත කර ඇති බව. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාරම්මල උප පර්යේෂණ මධ්‍යස්ථානයේ විද්‍යාගාරයට සම්බන්ධ නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා 2018 වර්ෂයේදී රු.29,200,000 ක ඇස්තමේන්තුවක් සකස් කර ඉදිකිරීම් ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිම කර තිබුණේ රු. 8,084,500 ක වැඩ පමණි. බිත්ති කපරාරු කිරීම වැනි වැඩ නිම කර නොතිබුණු බැවින් ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවතුණි. | නව දෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීම 2018 වර්ෂයේදී අදියර කිහිපයකින් නිමකිරීමට අපේක්ෂාවෙන් ආරම්භ කළද 2019/2020 වර්ෂ වල ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වූ බැවින් ඉදි කිරීමේ වැඩකටයුතු නිම කිරීමට නොහැකි වූ බව. | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිමකර ප්‍රයෝජනයට ගත යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ පර්යේෂණ මධ්‍යස්ථාන 03 ක තිබෙන අක්කර 17.3 ක ඉඩම් කිසිදු ඵලදායි ආර්ථික කටයුත්තකට යොදා නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. | වල්පිට හා නිල්ලඹ උප පර්යේෂණ මධ්‍යස්ථානවල ඉඩම් ඉදිරියේදී උපයෝජනය කිරීමට සැලසුම්කර ඇති අතර දැල්පිටිය උප පර්යේෂණ මධ්‍යස්ථානය භාවිතය නිසරු බැවින් සංවර්ධනය කිරීම සඳහා අධික මූල්‍ය පිරිවැයක් දැරීමට සිදු වන බව. | ඉඩම ඵලදායිව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව පරිහරණය කරන අක්කර 390 ක ඉඩම් කොටස් 31 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම්වලට අදාල පවරා ගැනීමේ කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඇතැම් ඉඩම් පවරාගැනීමේ ක්‍රියාවලියේ අවසන් අදියර කිහිපයේ පවතින බව. | ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුව භාවිතා කරන වාහන 34 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන අතුරින් 18 ක් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් පවරා ගැනීමට කටයුතු කරන අතර මුදල් අමාත්‍යාංශය සතු වාහන අතරින් අඩුපාඩු සහිත ගොණු 09 ක් සකස් කර නැවත යැවීමට කටයුතු කර ඇති බව. | වාහන වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්යය මණ්ඩලය, තථ්‍ය කාර්යය මණ්ඩලය සමඟ සැසඳීමේදී තනතුරු 339 ක පුරප්පාඩු පැවතුණි. ඒ අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 23 ක්, ව්‍යාපෘති නිලධාරි තනතුරෙහි පුරප්පාඩු 170 ක් පැවති අතර පර්යේෂණ හා සංවර්ධන සහකාර තනතුරු 84 ක් අනුමත කර තිබුණද එම තනතුර සඳහා කිසිදු නිලධාරියෙකු බඳවාගෙන නොතිබුණි. එසේම ගොවිපල කළමණාකරු තනතුරු 11 ක් පුරප්පාඩුව පැවතුණි. | ඉදිරියේදී පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබන බව. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිය යුතුය. |